හවරි බඳින කාන්තාවට හා හවරි බඳින මෙන් පතන කාන්තාවටත් පච්චා (ටැටූ) කොටන කාන්තාවට හා පච්චා කොටන මෙන් පතන කාන්තාවටත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ශාප කළහ

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී:
"හවරි බඳින කාන්තාවට හා හවරි බඳින මෙන් පතන කාන්තාවටත් පච්චා (ටැටූ) කොටන කාන්තාවට
හා පච්චා කොටන මෙන් පතන කාන්තාවටත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ශාප කළහ."
[صحيح] [متفق عليه]

පාර්ශව හතරක් වෙත ශාප කිරීම, නෙරපනු ලැබීම, දුරස් කිරීම පතමින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්රාර්ථනා කළහ. පළමුවැන්නා: තමන්ගේ හෝ වෙනත් කෙනෙකුගේ හිසකෙස් සඳහා වෙනත් හිසකෙස් භාවිතා කර හවරි බඳින කාන්තාව. දෙවැන්නා: තමන්ගේ හිසකෙස් සඳහා වෙනත් හිසකෙස් භාවිතා කර හවරි බඳින ලෙස වෙනත් කෙනෙකුගෙන් පතන කාන්තාව. තුන්වැන්නා: අලංකාරය හා විලාසිතාව අපේක්ෂාවෙන් මුහුණ, අත හෝ පපුව වැනි ශරීරයේ විවිධ ස්ථානවල, කටු භාවිතා කර පච්ච කොටා එහි සළකුණු නිල් හෝ කොළ පැහැය ගන්නා තරමට වර්ණ ගැන්වීම. සිව්වැන්නා: එසේ පච්චා කොටන මෙන් ඉල්ලා සිටින්නා. මෙම ක්රියාවන් මහා පාපයන් වෙති.

https://sunnah.global/hadeeth/si/show/58099